**ශීර්ෂය 213 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (1)16වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී .

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) වාණිජ අත්තිකාරම් ගිණුම

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 දෙසැම්බර් 31 දිනට රු.511,397,303 ක් වූ අවසාන තොගයේ වටිනාකම ප්‍රවර්ථන වර්ෂයේ නිෂ්පාදන ගිණුමේ ආරම්භක ශේෂය රු.509,916,122 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂයේ නිෂ්පාදන පිරිවැය හා ලාභය රු.1,481,181 කින් පිළිවෙලින් අඩුවෙන් සහ වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කර ගිණුම් සැකසීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇති බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආරම්භක ශේෂ නිවැරදිව සටහන් කල යුතුය. |
| (ii) | අනුමත අත්තිකාරම් ගිණුම අනුව දැක්වෙන රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුවට හා රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස පිළිවෙලින් රු.2,253,600 ක් හා රු.168,097,238 ක් දක්වා තිබුණද එම ආයතන වල මූල්‍ය ප්‍රකාශන අනුව එම අගයන් පිළිවෙලින් රු.26,044,505 ක් හා රු.715,624,110 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් පිළිවෙලින් රු.23,790,905 ක හා රු.547,526,872 ක නොසැසඳීම් පැවතුණි. | ලිඛිත තහවුරුවක් ලබා ගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ණයහිමි ශේෂ නිවැරදිව ගිණුම් වල ඇතුලත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2022 වර්ෂයට අදාළ 03 ශ්‍රේණිය දෙමළ වැඩපොත නියමිත දිනට මුද්‍රණය කර ලබා නොදීම මත අය කරගන්නා ලද රු.505,236 ක දඩ මුදල ගිණුම් ගත වී නොතිබ්මෙන් දඩ මුදල් ලැබීම් ආදායම රු.505,236 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අතපසු වීමකින් මගහැරී ඇති බව. | ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (iv) | 2023 දෙසැම්බර් 31 දිනට අනුමත අත්තිකාරම් ගිණුමේ ඇතුළත් මුද්‍රණ ආයතන 18 ක් වෙත ගෙවිය යුතු රු.2,274,851,649 කට අදාළ ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ණයහිමි ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි විය. | ණය හිමි ශේෂය තහවුරු කර දෙන ලෙස අදාල මුද්‍රණ ආයතන දැනුවත් කර ඇති බව. | ණයහිමි ශේෂ සනාථන සෘජුවම විගණනය වෙත ලැබීමට සැලැස්විය යුතුය. |
| (v) | 2009 වර්ෂයේ සිට නැෂනල් ජේපර් කොම්පැනි ලිමිටඩ් වෙතින් අයවිය යුතු රු.7,431,012 ක මුදල සමාලෝචිත වර්ෂය තුළ දී අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | අදාල ණය කපා හැරීම සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශය සමඟ කටයුතු කරමින් පවතින බව. | අයවිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතු අතර කාලීනව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු නොකල නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි ඇතුලත් රු. මිලියන 92.14 ක් වටිනා හෝමාගම පිටිපන පිහිටි පෙළපොත් ගබඩා සංකීර්ණය ඉදිකර තිබෙන ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගෙන නොතිබුණි. | ඉඩමට අදාලව හෝමාගම දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් එහි තීන්දුව ලද පසු පැවරීම් කටයුතු සිදු කල හැකි බව හෝමාගම ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති බව. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | අනුමත අත්තිකාරම් ගිණුමට අදාළ ස්ථාවර වත්කම් ලේඛනය හා මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනය අතර ස්ථාවර වත්කම් අයිතම 8 ක වටිනාකමෙහි රු.39,089,545 ක ශුද්ධ වෙනසක් පැවතුණි. | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සටහන් කරනු ලබන්නේ සිගාස් දත්ත සැකසුමේ වර්ගීකරණය අනුව වන අතර 2022 වර්ෂයේ සිට සිගාස් දත්ත සැකසුම පරිදි අනුමත අත්තිකාරම් ගිණුමට වත්කම් ඇතුලත් කිරීමට කටයුතු කරනු ලබන බව. | මූල්‍ය ප්‍රකාශනවල අතුළත් වටිනාකම් ඊට අදාළ අනෙකුත් වාර්තා සමඟ සැසඳිය යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **හානි පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී හානි පිළිබඳ ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, අදාළ ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |

**(ඈ) විගණන සාක්ෂි නොවීම**

| නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ දක්වා ඇති රු.92,145,416 ක් වටිනා ඉඩම සහ රු.187,950,284 ක් වටිනා ගොඩනැගිලිවල අගයන් තහවුරු කිරීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ස්ථාවර වත්කම්වල අගය තහවුරු කර ගැනීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50(1) ප්‍රකාරව, වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව හා අවශ්‍යතාවයන් හඳුනාගෙන සකස් නොකිරීම | ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉල්ලුම් කල මුදලට වඩා GEM ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 55 ක් වැඩිපුර ලබා දී ඇති බව. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව හා අවශ්‍යතාවයන් හඳුනාගෙන සකස් කල යුතුය. |

හේතුවෙන් වැඩසටහන් (2) යටතේ ප්‍රාග්ධන වැය සඳහා ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු.84,000,000 ක් වූ අතර මු.රෙ.66 මාරුකිරීම් යටතේ රු.1,100,000 ක් ලබා ගැනීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය රු.85,100,000 ක් වී තිබුණි. ඉන් රු.10,675,284 ක් පමණක් වියදම් දැරීමෙන් පසු සියයට 87ක් ඉතිරි වී තිබුණි.

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන වාහන තුනක ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට 2024 අගෝස්තු 31 දින දක්වාම කටයුතු කර නොතිබුණු අතර එම වාහන 03 සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 1,677,331 ක වියදමක් දරා තිබුණි. | දෙපාර්තමේන්තුව ට පවරා ගැනීමේ ඉල්ලීම් ලිපි අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |
| (ii) | 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම විස්තරාත්මක හා පැහැදිලි ලෙස සකස් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළ යුතුය. |

## 2.3 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව එකතුව රු.557,574 ක් වූ හඳුනානොගත් ලැබීම් අයිතම 116 ක් පැවතුණි. | විදුහල්පති දීමනා ගෙවීමේ දී බැංකුව වෙත නැවත ලැබීම් වන අතර ඒවා බැංකු ගිණුම් අංක වැරදීමෙන්, බැංකු ශාඛා වැරදීම් හා වසා ඇති බැංකු ගිණුම් වැනි අවස්ථා නිසා මෙසේ සිදුවී ඇති බව. | ලැබීම් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව, කටයුතු කල යුතුය. |

**3.2 විදේශ ආධාර ව්‍යාපෘති**

**3.2.1 සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති අරමුදල් භාවිතය.**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඩිජිටල් ඉගෙනුම් ආධාරක වල ඵලදායීතාවය තීරණය කිරීම සඳහා තෝරාගත් මාතෘකාවන් 07 ක් සම්බන්ධව පර්යේෂණයක් සිදු කිරීමේ අරමුණින් ඊට අදාළ යෝජනා ලබා ගැනීම සඳහා 2023 මාර්තු සහ අප්‍රේල් මාසයන්හිදී රු.519,350 ක් වැය කර අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් 21 ක් සඳහා වැඩමුළු 05 ක් පවත්වා තිබුණි. නිලධාරීන් විසින් මාතෘකාවන් 06 ක් ඉදිරිපත් කර තිබුණද ඉන් එක මාතෘකාවක් පමණක් අවශ්‍ය අරමුණට අදාලව ඉදිරිපත් කර තිබුණි. | මෙම යෝජනා නිදහස් යෝජනා ලෙස ඉදිරිපත් කර තිබුණු බව. | අරමුණු ගත කාර්යයන් ඉටුකිරීම සඳහා ඵලදායීව ක්‍රියා කල යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් කර තිබුණු අපේක්ෂිත ක්‍රියාකාරකම් **(Activities)** 8 න් 6 ක් සඳහා උප ක්‍රියාකාරකම් **(Sub Activities)** හඳුනාගෙන නොතිබුණි. එසේම විෂයයන් 07 කට අදාළව සැලසුම් කර තිබුණු ඩිජිටල් ඉගෙනුම් ආධාරක කුමන ශ්‍රේණිවල සිසුන් වෙනුවෙන් කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරනවාද යන්න පිළිබඳව නිශ්චිතව සඳහන් කර නොතිබුණි. | සැලසුමක අන්තර්ගතය පිළිබඳ අදාල උපදෙස් සැලසුම අනුමත කරනු ලබන පාර්ශවය විසින් ලබා දිය යුතු බව දක්වා තිබුණු බව. | ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට අදාළ ක්‍රියාකාරකම් විස්තරාත්මකව දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ අරමුදලින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත වෙන්කර තිබුණු රු.80,000,000 ක ප්‍රතිපාදන වලින් ක්‍රියාකාරකම් පහක් සඳහා රු.5,600,025 ක් එනම් ප්‍රතිපාදිත මුදලින් සියයට 7ක් පමණක් වැය කර තිබුණි. | මුදල් නිසි කාලයට නොලැබීම හේතුවෙන් සැලසුම් සාර්ථක කර ගැනීමට නොහැකි වී ඇති බව. | වර්ෂයට අදාල ප්‍රතිපාදන උපයෝජනය කරගෙන සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් සිදුකල යුතුය. |
| (ඈ) | 2022 වර්ෂයේ ව්‍යාපෘතියේ අරමුදල් රු.7,678,441 ක් භාවිතා කරමින් ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ සම්පත් පොත (16+) පිටපත් 15 ,000 ක් මුද්‍රණය කර තිබුණි. ඉන් 2024 අප්‍රේල් 30 දිනට බෙදාහැරිමකින් තොරව පොත් 1765 ක් ගබඩාවේ ඉතිරි වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | සැලසුම් ගත පරිදි මුද්‍රණය කල පොත් බෙදාහැරීම් සිදුකල යුතුය. |

**3.3 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලංසු ලියවිලිවල කොන්ත්‍රාත් දත්ත යටතේ (10.0) ට අනුකූලව ප්‍රවාහනයට යොදා ගන්නා ලොරි රථයට සහ පෙළපොත් ආරක්ෂා වන පරිදි රු.1,000,000 රක්ෂණාවරණයක් ලබා ගත යුතු වුවද, පෞද්ගලික ප්‍රවාහන ආයතනයක් විසින් පෙළපොත් ප්‍රවාහනයට යොදා ගෙන ඇති ලොරි රථ 08ක් සඳහා එම රක්ෂණාවරණය ලබාගෙන නොතිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කරන බව. | ලංසු ලියවිලි වල දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා ගත යුතුවීම. |
| (ආ) | ලංසු ලේඛණවල මිල ගණන් ඉදිරිපත් කිරිමේ පෙර සටහන් අංක 6.0 සහ 9.0 හි දක්වා දී ඇති කොන්දේසි ප්‍රකාරව ලංසුකරු විසින් ලංසු ලේඛණ සමඟ ඉදිරිපත් කළ අමතර වාහනයට අදාල සපුරාලියයුතු අවශ්‍යතාවයන් කිසිවක් සම්පූර්ණ කර නොතිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කරන බව. | ලංසු ලියවිලි වල දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා ගත යුතුය. |

### 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජූනි 01 සිට 2023 සැප්තැම්බර් 12 දක්වා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 05 දෙනෙකු මිනිස් දින 19 ½ ක් සඳහා රාජකාරි නිවාඩු ලබාගෙන විභාග දෙපාර්තමේන්තුවේ ආයතන විභාග කාර්යයන්වල නිරත වී තිබුණු අතර ඉන් නිලධාරීන් 04 දෙනෙකු මිනිස් දින 09 ක් සඳහා උක්ත කාර්යයන්වල යෙදී නොතිබුණි. | විභාග රාජකාරි සඳහා යෙදවීමේදී අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටි පිළිබඳ අධ්‍යාපන ලේකම්ගෙන් උපදෙස් ඉල්ලා ඇති බව. | රාජ්‍ය නිලධාරීන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව රාජකාරි නිවාඩු ලබාගැනීම සිදු කල යුතුය. |
| (ආ) | 2023 අධ්‍යයන වර්ෂය සඳහා සාමාන්‍ය පෙළපොත් පිටපත් 32,890,400 ක් මුද්‍රණය කර ගැනීම සඳහා මුද්‍රණ ආයතන 26ක් සමග රු.14,211,128,357 ක වටිනාකමකට ගිවිසුම් ගත වී තිබුණද පළමු පාසල් වාරය ආරම්භ කිරීමට පෙර එම පෙළපොත් ඇතුළුව දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරනු ලබන බ්‍රේල් පෙළපොත් 4,039 ක් ද බෙදා අවසන් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | 2024 අධ්‍යයන වර්ෂය ආරම්භයට පෙර ඇනවුම් කර තිබුණු පෙළපොත් පාසල් හා බෙදාහැරීම් මධ්‍යස්ථාන වෙත නිකුත් කර ඇති බව. | අධ්‍යාපන කටයුතු වලට බාධාවක් නොවන පරිදි නියමිත කාලය තුල පෙළපොත් බෙදා හැරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ලොරි රථය ගබඩාවෙන් පිටත් වූ දිනයත්, නැවත ගබඩාවට පැමිණි දිනයත්, පරීක්ෂා කිරීමේදී, එම දිනයන් අතරතුර, වෙනත් ප්‍රදේශයක එම ලොරි රථය පෙළපොත් ප්‍රවාහනයට යොදාගෙන ඇති බව පෙළපොත් භාරව යන නිලධාරියා විසින් පිළියෙල කරන වාර්තාව අනුව අනාවරණය විය. ඒ අනුව පෙළපොත් බෙදාහැරීමේ නිලධාරීන් වෙනුවෙන් ගෙවා තිබුණු රු.2,262,500 ක මුදලේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | 2023 වර්ෂයට අදාලව හඳුනාගත් මෙම ගැටළුව 2024 වර්ෂයේදී විසඳීම සඳහා අවශ්‍ය ක්‍රමවේද අනුගමනය කර ඇති බව. | පෙළපොත් බෙදාහැරීම් කටයුතු විධිමත් ක්‍රමවේදයක් යටතේ සිදු කළ යුතුය. |